දිවි තොර කර ගැනීම් සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී, උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය යයි මාධ්‍ය ආචාර ධර්ම සඳහන් කරයි. මන්ද යත්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇති අයෙකුට එම හදිසි උපකාරක අංක ඔස්සේ, තම මානසික සංකූලතාවය විසඳා ගැනීමට අවශ්‍ය සහාය ලබා ගෙන, දිවි තොර කරගැනීමේ මානසිකත්වයෙන් මිදීමට ඉඩක් ලැබීමයි.

ඒ අනුව, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවය ඇති අයෙකුගේ ජීවිතයක් බේරා ගැනීමට ලැබෙනා ඉඩත්, ඉන් සමාජය තුළ ඇති කළ හැකි ධනාත්මක බලපෑමත් සැළකිල්ලට ගනිමින් දිවි තොර කරගැනීමේ පුවත් සමගින් උපකාරක අංක සඳහන් කිරීමේ වැදගත්කම Ethics Eye අපි විසින් දිගින් දිගටම අවධාරණය කළෙමු.

The Morning පුවත්පතේ (10/18) සුමිත්‍රයෝ උපකාරක සේවාව පිළිබඳව පළ කර තිබූ ලිපිය සමගින් හදිසි උපකාරක අංක සඳහන් කර ඇති අතර, තම මානසික සෞඛ්‍ය පිළිබඳ සැළකිලිමත් වීමටත්, හදිසි උපකාරක අංක සේවාවන් ලබාගැනීමටත් සමාජය දිරිමත් කර ඇත. එය සැබැවින්ම ප්‍රශංසා කටයුතු වාර්තාකරණයකි.

මේ අයුරින් දිවි තොර කරගැනීම් සම්බන්ධ වාර්තාකරණයන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමේ භාවිතයක් අනෙක් මාධ්‍යයන් තුළද තව තවත් දක්නට ලැබෙනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වන්නෙමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**#MediaEthicsSL #lka #TheMorning**